# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

REACHING NATIONS

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX YEAR OF OUR LORD JESUS CHRIST, 2025 JULY Issue No. 08


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 8:1-9)

01. අපගේ ස්වාමිවූ ස්වාමීන්වහන්ස,. ඔබගේ නාමය පෘථිවිය මුළුල්ලෙහි කොපමණ උතුම්ද! ඔබ ස්වකීය මහිමය අහස්තල මත්තෙහි තැබූසේක.

02. සතුරාද පළිගන්නාද නිශ්ශබ්දකරන පිණිස, ඔබගේ විරුද්ධකාරයන් නිසා, ඔබ බාලයන්ගේද කිරිබොන බිළිඳුන්ගේද මුඛයෙන් බලය පිහිටෙවුසේක.

03. ස්වකීය ඇඟිලිවැඩයවූ ඔබගේ අහස්තලයත් ඔබ පිහිටෙවූ සඳ හා තාරකාත් බලා කල්පනාකරන කල;

04. ඔබ මනුෂ්‍යයා සිහිකිරීමට ඔහු කවරෙක්ද? ඔබ මනුෂ්‍යපුත්‍රයා සැලකීමට ඔහු කවරෙක්ද?

05. ඔබ ඔහු දෙවියන්වහන්සේට නොහොත්, දේවදූතයන්ට. මදක් පමණක් පහත්කොට සෑදූසේක, මහිමය හා ගෞරවය නමැති ඔටුන්නෙන් ඔහු සරසනසේක.

06. ඔබගේ හස්තකර්ම කෙරෙහි ඔහු අධිපති කළසේක; එසේය, සියල්ල ඔහුගේ පාද යට දැමූසේක.

07. එනම් සියලු බැටළුවන් සහ ගවයෝද, එසේය, වනයෙහි මෘගයෝද;

08. ආකාශයෙහි පක්ෂීන් සහ මුහුදේ මත්ස්‍යයෝද, මුහුදු මාර්ගවල යන්නාවූ සියල්ලෝද යන මොව්හුය.

09. අපගේ ස්වාමිවූ ස්වාමීන්වහන්ස, ඔබගේ නාමය මුළු පොළොවෙහි කොපමණ උතුම්ද!

## ඔබව ඵල දරන පිණිස තෝරාගෙන ඇත.



YOU ARE CHOSEN TO BEAR FRUIT! (සහෝදරී ඒන්ජල්)



අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඔබ සියලු දෙනාටම ආසිරි පතමි!

දෙවියන්වහන්සේගේ මහත් වූ කරුණාවෙන් මේ වර්ෂයේ මාස පහක් ගෙවී ඇති අතර තවත් ඉතිරිව ඇත්තේ මේ වර්ෂයේ අඩක් පමණි. එම කාලයට ඇතුල් වීමට දෙවියන් වහන්සේ අපට උපකාර කර තිබේ.

මේ වර්ෂයේ අප තවත් ඉදිරියට යන විටදී, කී දෙනෙක් මේ වසර ආරම්භ කිරීමට පෙර ගත් තීරණවල ස්ථිරව සිටිනවාද? අද අප ජීවත් වන්නේ පෙර ගත් තීරණ කරනකොට ගෙනයි. එසේම හෙට දවසේ දේවල් සිදුවන්නේ අද අප ගන්නාවූ තීරණය කරන කොටගෙනයි.

සෑමදාම අප විවිධ තීරණ ගැන සිතමු. කුමක් කමුද? කුමක් අඳිමුද? කොහේ යන්නද? මොන වගේ වැඩක් කරන්නද? කියා සිතමින් බොහෝ විට අප හදිසි තීරණ වලටද යන්නෙමු.

මේ සෑම දේ තුලදී යේසුස්වහන්සේගේ හඬින් අපිට පවසන් නේ; ''මම නුඹව තෝරා ගත්තෙමි'' කියාය.

*''නුඹලා මා තෝරා ගත්තා නොව මම නුඹලා තෝරාගෙන පත් කළෙමි..........'' (යොහාන් 15:16)* හී පවසා ඇත.

අපගේ ආත්මික ගමනේදී අප ගන්නාවූ තීරණ ගැන අප බොහෝ සෙයින් ආඩම්බරයට පත්වෙමු. නමුත් දෙවියන්වහන්සේ පවසන්නේ, අපගේ තීරණ නම්;

3 වෙනි පිටුවට ...




Echo of His Call

Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu


Every day – From 2.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

* Please Subscribe and Share *

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

# from your dearly beloved brother...



REACHING NATIONS



## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
EX MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org
YOUTUBE CHANNEL
Echo of His Call

**"මක්නිසාද ස්වාමීන් වහන්සේ නුඹේ විශ්වාස භූමියව, නුඹේ පය අසු නොවන ලෙස ආරක්ෂා කරන සේක."**

**- හිතෝපදේශ 3:26**

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රේමවන්තයෙනි,**

අපගේ ස්වාමි වූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනර්ඝ නාමයෙන් ඔබට උණුසුම් සුභපැතුම් ගෙනෙමු !

දෙවියන්වහන්සේගේ අනර්ඝ කරුණාව කරණකොට ගෙන, විශේෂ මාසයක් වූ ජුනි මාසය තුළින් අප ගමන් කරනු ලැබුවේය. මෙම ජුනි මාසය තුළ බොහෝ සේවා කටයුතුවල නිරත වීමට අපට හැකියාව ලැබිණි. කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව, ශුභාරංචි පත්‍රිකා මුද්‍රණය කිරීම, ප්‍රධාන සභාව සහ ශාකා සභාවන්, තැපැල් මාර්ගික පාඩම් මාලාව, දේව ධාර්මික තැපැල් මාර්ගික පාඩම් මාලාව, නෙහෙමියා බයිබල් විදුහල, ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසල, නිවාඩු කාලීන බයිබල් පාසල, තරුණ සේවය, රෝහල් සේවය, පුරුෂ සහ කාන්තා සේවය, ධර්මදූත මධ්‍යස්ථානය, U-Tube සේවය සහ තවත් බොහෝ සේවාවල අපගේ කණ්ඩායම් නිරතව සිටියෝය.

සිය ගනන් කැපවූ පුද්ගලයින් විශ්වාසවන්තව මේ පළාත්වල සේවය කරනු ලැබීය. අපගේ ප්‍රධාන නායකයින් සැම මාසයකම යාච්ඤා කිරීමටත් සැලසුම් කිරීමටත් පළාත්වල සිදුවන සේවාවන් ගැන අධ්‍යයනය කිරීමටත් එකතු වූවෝය. මේ සියලුම දේ උදෙසා දෙවියන්වහන්සේ අපට උපකාර කළේය.



*Key Leaders gathered for monthly prayer in Church*

2025 ජුනි මස 7වන දින අපගේ තරුණ කඳවුර ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ පැවැත්වූවෙමු. තරුණ තරුණියන් 200කට වඩා වැඩි පිරිසක් මෙයට සහභාගී වූවෝය. මෙය ඉතාම අනර්ඝ බලවත් ආලේපය ලැබූ කාලයක් වූයේය. තරුණයින්ගේ ජීවිතවලට දිව්‍යමය දර්ශනයන් හා ආලේපයද ඔවුන්ගේ අනාගතයට කැඳවීමක්ද ලැබුවේය. එසේම ඔවුන්ගේ ජීවිතවල වෙනස් වීමත් ආත්මික ජීවිතයේ වෙනස් වීමත් අප දුටුවේය. අප විශ්වාස කරන්නා වූ කාරණය නම්; ඔවුන්ගේ ජීවිත කරන කොටගෙන ඔවුන්ගේ පවුල් වලටත් ඔවුන්ගේ පවුල්වල ගැලවීම නොලැබූ අය ගැලවීමට පැමිණෙයි කියාය. මේ සියලුම දේ උදෙසා අපි දෙවියන් වහන්සේට ස්තුතිය හා ගෞරවය පුද කරමු.

ජුනි මස 20 - 22 දක්වා යන දිනයන්හිදී අපගේ ප්‍රධාන සභාව සහ ශාඛා සභාවන්වල සියලු පවුල් සඳහා 'ආශිර්වාදය' යන තේමාව යටතේ විශේෂ කඳවුරක්

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development




**Special Youth Camp**

පැවැත්වූවෙමු.දෙවියන් වහන්සේ මෙම කඳවුරේ දී ඉතා පුදුම ලෙස ක්‍රියාකරමින් බොහෝ පවුල්වලට ආශිර්වාද කරනු ලැබුවේය. ඒ උදෙසා ඔබ කළ විශ්වාසවන්ත යාච්ඤාව නිසා ඔබ සැම දෙනාටම අපි ස්තුති කරමු.

අපගේ සියලුම සේවාවන් උදෙසාත් අප උදෙසාත් විශේෂයෙන් ඔබගේ යාච්ඤාව අපි බලාපොරොත්තු වෙමු. අප බොහෝ ආත්මික සටන්වලට මුහුණ දෙමින් සිටිමු. අන්ධකාර බලවේග වලට අප මුහුණ දෙමු. ඒ උදෙසා අපට සටන් කිරීමට සිදුවී තිබේ. ඒ නිසා අපට බොහෝ බාධාවන් තිබේ. අප ඔබගේ අනර්ඝ යාච්ඤාව- බලාපොරොත්තු වෙමු.

*ECHO OF HIS CALL PUBLICATION TEAM*

E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*

දෙවියන් වහන්සේ අපව තෝරාගත් නිසා දෙවියන්වහන්සේගේ තීරණයන් අපගේ ජීවිතයේ සිදුවෙයි කියාය.

යුදෙව් සංස්කෘතියට අනුව ගෝලයින් තම ගුරුවරයාව තෝරා ගත් ගත් නමුත් යේසුස් වහන්සේ එය වෙනස් කරමින් උන්වහන්සේ පවසන්නේ; අපව තෝරාගත් බවයි.

## 1). සන්දර්භය තේරුම් ගනිමු.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කතා කළාවූ කාරණාවන් තුළ තිබෙන්නා වූ වැදගත් භාවය අප තේරුම් ගන්නට අවශ්‍ය වෙයි. ගෝලීන්ගේ මනසේ තිබුණාවූ ඔවුන්ගේ හැඟීම් ගැන දෙවියන් වහන්සේ කතා කරයි. එනම්; " නුඹලා මාව තෝරා ගත්තේ නැත, නමුත් මම නුඹලාව තෝරා ගත්තෙමි" කියා පැවසුවේය.

## 2). ඉතිහාසයේ සංදර්භය.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අවසාන පාස්කු රාත්‍රී කෑමේදී යොහාන් 15:16 වන පදයෙහි සඳහන් කර ඇති ආකාරයට උන්වහන්සේ ගෝලයින්ට කතා කරනු ලබන්නේ යුදෙව් සංස්කෘතියට අනුව නොවේය. දෙවියන් වහන්සේගේ සෙනගය කියා පවසන්නේ; "උන්වහන්සේ විසින් තෝරාගත් පුද්ගලයින්ය" කියා ඔවුන්ට තේරුම් කර දුන්නේය. උන්වහන්සේ යෙරුසලමේ තිබූ එම උඩුමහලේ සිට තම ගෝලයන් 12 දෙනා සමග රාත්‍රී භෝජනය භුක්ති වින්දේය. උන්වහන්සේගේ අවසාන ඉගැන්වීම උන්වහන්සේ එහිදී ඉටු කරනු ලැබීය. උන්වහන්සේ ස්වර්ගස්ථ වූ විට ගෝලයින් කොයි ආකාරයට සිටිය යුතුද කියා උන්වහන්සේ අවසාන පැය කීපය තුළදී කතා කළ වචනය අරමුණක් ඇතිව කතා කළේය. එසේම උන්වහන්සේ ගැඹුරු තේරුමකින් හා ප්‍රේමයෙන් තම ගෝලයින්ට කතා කළේය.

## 3). ගෝලයින්ගේ හැඟීම්බර තත්ත්වය.

යේසුස්වහන්සේගේ ගෝලයන් වසර තුනකට වඩා වැඩි කාලයක් උන්වහන්සේ සමග සිටිමින්, උන්වහන්සේ සමග එකට කෑමකමින්, උන්වහන්සේ සමග ඇවිදිමින් සේවය කළෝය. රෑ දාවල් උන්වහන්සේගෙන් ඉගෙන ගත්තේය. ඔවුන්ට තිබූ සැම දේම අතහැර ඔවුන් යේසුස්වහන්සේ පසුපස ගමන් කරමින් උන්වහන්සේව අනුගමනය කළෝය. මෙවැනි අවස්ථාවේදී ඔවුන්ගේ මානසික හැඟීම් ගැන අපි සිතා බලමු.

දැන් එක්විටම යේසුස්වහන්සේ ඔවුන්ට කතා කරමින්; "නුඹලා අතරින් එක්කෙනෙක් මාව පාවා දෙන අතර තවත් කෙනෙක් මාව ප්‍රතික්ෂේප කරනවාය" කියා පවසනු ලැබීය. එවැනි අවස්ථාවකදී ගෝලයින්ගේ හදවත තුළ පැන නැගුණු හැඟීම් ගැන ඔබට සිතා ගැනීමට හැකිද?

සමහරවිට මෙය කියවන්නාවූ ඔබ එවැනි තත්ත්වයක සිටිනවා විය හැකිය. ඔබගේ ලෝකය, ඔබගේ බලාපොරොත්තු හා ඔබගේ විශ්වාසවන්තකම දෙදරා යන්නා වූ ස්ථානයක සිටිනවා විය හැකිය. මෙවැනි අවස්ථාවකදී මා කුමක් කරන්නද කියා ඔබ අසන්නට පුළුවන. එසේ නම් දෙවියන් වහන්සේ ඔබට විශේෂ පණිවිඩයක් තබා තිබේ.



## PRAYER REQUEST:

Kindly uphold our 3-Day Family Camp, scheduled for August 8 to 10, 2025, in your prayers.

විශේෂයෙන් අපට ඉතා අමාරුම අවස්ථාවන්වලදී යේසුස් වහන්සේ ගෝලයින්ට කතා කලාක් මෙන් අපටද කතා කරයි. උන්වහන්සේ ගෝලයින්ට පවසනු ලැබුවේ නුඹලා ඵලදරන්න කියාය. කිසියම් කෙනෙක් අභියෝගවලට මුහුණ දෙන විටදී ඵල දරන්නේ කෙසේද?

මෙම පණිවිඩය මා කොටස් දෙකකට බෙදා ඔබ සමග කතා කිරීමට කැමැත්තෙමි. එනම්; පළමුව අපව තෝරාගත් අරමුණ ගැන දෙවනුව ඵලදැරීම ගැනය. යොහාන් 15:16 හි පවසන පරිදි තෝරා ගැනීමත් හා ඵලදැරීමත්ය.

## I. දිව්‍යමය තෝරා ගැනීම

### දෙවියන් වහන්සේගේ තෝරා ගැනීම අංශ හතරකි!

### (a) දෙවියන් වහන්සේ සම්බන්ධතාවයන් ආරම්භ කරයි!

දෙවියන් වහන්සේගේ වචනය නිතරම අපට පෙන්වා දෙන්නේ උන්වහන්සේ අප හා සමඟ සම්බන්ධතාවය පැවැත්වීමට කැමති බවයි. යේසුස්වහන්සේ පවසන්නේ; ''මම නුඹව තෝරාගත්තෙමි'' කියාය. ''තෝරාගැනීම'' යන්නට ග්‍රීක භාෂාවේ අර්ථය නම් යම් කොටසක් අතරින් කෙනෙක්ව තෝරා ගැනීමයි. එපීස 1:4 හි සඳහන් කරන ආකාරයට; ***''ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ අප තෝරාගත් ලෙසම ..........''*** යනුවෙනි. දෙවියන් වහන්සේ අපව තෝරාගනු ලබන්නේ උන්වහන්සේ මේ ලෝකය ආරම්භ කිරීමටත් පෙරය කියා පවසයි.

දෙවියන්වහන්සේ සියලු මනුෂ්‍යයන් අතරින් අපව තෝරා ගනු ලැබුවේය. නමුත් මනුෂ්‍යයන් සිතන්නේ ඔවුන් උන්වහන්සේව තෝරා ගත්තේ කියාය. නැතිවූ බැටළුවාගේ උපමාව දෙස බලන විටදී එඬේරා නැති වූ බැටළුවන්ව සොයා ගෙන උන් පසු පස්සේ ගියේය. එසේම අපගේ යහපත් බැටළු එඬේරාණන් වන යේසුස් වහන්සේ අපව සොයමින් අප පසුපස පැමිණෙයි. උන්වහන්සේ අපව සොයාගෙන නැවත උන්වහන්සේ සමඟ සම්බන්ධතාවයන් පැවැත්වීමට කැමැත්තෙන් සිටී.

දිව්‍යමය තෝරා ගැනීම කියා පවසන්නේ; පුද්ගලිකව සිදුවන දෙයකි. මේ ලෝකයේ සිටින සෙනඟ අතර උන්වහන්සේ ඔබව තෝරා ගෙන සිටියි. එය කොපමණ අනර්ඝ දෙයක්ද!

එනම් උන්වහන්සේ ඔබවත් මාවත් තෝරාගෙන සිටින්නේ කිසියම් අරමුණක් සඳහාය. අපි සාමාන්‍යයෙන් ලෝකය මැවීමට අයිති අය නොවෙයි. අපිව දෙවියන් වහන්සේ විසින් තෝරාගෙන උන්වහන්සේගේ කැමැත්තට අනුව මවා ඇති විශේෂිත අයයි. මෙම සත්‍යතාවය අප තේරුම් ගත යුතුයි.

### (b). අසීමිත කරුණාව!

දෙවියන්වහන්සේ තෝරා ගැනීමක් කරනු ලබන්නේ අපගේ හැකියාවන් දෙස බලා නොවේය. රෝම 9:11-12 දක්වා කොටසෙහි අපට ප්‍රකාශ කරනු ලබන්නේ යාකොබ් සහ ඒසව් යන දෙදෙනා හොඳ නරක කිරීමටත් ප්‍රථමයෙන් දෙවියන් වහන්සේ ඔවුන්ව තෝරා ගත් බවයි. දෙවියන් වහන්සේගේ කරුණාව අප කරන ක්‍රියාව නිසාවත් අපගේ වැරදීම නිසාවත් නොවේය. නමුත් උන්වහන්සේගේ ක්‍රියාව අපට නොමිලයේ දෙනු ලබයි. අපගේ යහපත් ක්‍රියා නිසාවත් අයහපත් ක්‍රියා නිසාවත් නොව දෙවියන් වහන්සේගේ කරුණාව, අප කෙරෙහි සීමාවක් නොමැතිව වගුරුවා අපව තෝරාගෙන තිබෙයි.

ඔබ අතරින් කිසියම් කෙනෙක් මා බයිබලය කියෙව්වේ නැත, මා යාඥා කළේ නැත මට සුදුසුකමක් නැත කියා සිතනවා නම්; ඔබගේ හැඟීම් වෙනස් කරගන්න. ඔබට දෙවියන් වහන්සේගේ අනුග්‍රහය තිබේ.

නමුත් යාච්ඤා කිරීම හා දේව වචනය කියවීමෙන් අපට දෙවියන්වහන්සේ සමඟ සම්බන්ධතාවයක ගත කරන කාලය තුළ දෙවියන් වහන්සේ සමඟ වර්ධනය වීමට අපට උපකාර වෙයි. තවද දෙවියන් වහන්සේගේ කැමැත්ත දැනගැනීමටත් උන්වහන්සේ ප්‍රියවන ජීවිතයක් ගත කිරීමටත් අපට උපකාර කරයි. එසේම ඇදහිල්ලෙන් ජීවත්වීමටත් උන්වහන්සේගේ මහත් වූ කරුණාව අපට තිබේ.

යේසුස්වහන්සේ මේ ලෝකයට පැමිණ කුරුසිපත් වී මළවුන්ගෙන් නැගිටුවනු ලැබුවේ මේ නිසාය. උන්වහන්සේ සර්වබලධාරී දෙවි පියාණන් වහන්සේය. උන්වහන්සේ අපව

....Contd. to page 6




**ඉතා හදිසි දැනුම් දීමක්!**

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: sam@echoofhiscall.org

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිදු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජූලි:19** - 2025 සිට 2026 අධ්‍යයන වර්ෂය සඳහා නෙහෙමියා බයිබල් විද්‍යාලය සහ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලට නව ශිෂ්‍යයෙන් ඇතුළත් කිරීමට දෙවියන්වහන්සේ ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**ජූලි:20**- අපගේ සියලුරුම සහකාර කතෘවරුන් සහ ඔවුන්ගේ පවුල්වලට උන්වහන්සේගේ අනුග්‍රහය ලැබුණු නිසා ස්තුති කරන්න.

**ජූලි:21** - අපගේ සභාවන්වල සේවය කරන්නා වූ දේව ගැතිවරුන් සහ සහකාර සේවකයින් නිසා ස්තුති කරන්න.

**ජූලි:22**- අපගේ සේවාවන්වලට පුද්ගලික ලෙස මුල්‍යමය වශයෙන් සහාය දක්වන්නා වූ හවුල්කරුවන් අපිට ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**ජූලි:23** - ප්‍රධාන සභාවට නව ඇදහිලිවතුන් එකතු කළ නිසා ස්තුති කරන්න.

**ජූලි:24**- ශුභාරංචිය ළඟා නොවූ ප්‍රදේශවලට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට අපට හැකි වූ නිසා ස්තුති කරන්න.

**ජූලි:25**- අපගේ සේවයේ යෙදී සිටින අයගේ නොසැලෙන කැපවීම නිසා ස්තුති කරන්න.

**ජූලි:26**- අපගේ ජාතීන් කෙරෙහි උන්වහන්සේගේ ආරක්ෂාව තබා තිබෙන නිසා ස්තුති කරන්න.

**ජූලි:27**- අලුතෙන් ගැලවීම ලැබූ අය අපගේ සභාවෙහි සාමාජිකත්වය ගෙන ඇති නිස ස්තුති කරන්න

**ජූලි:28**- අපගේ සම්බන්ධීකාරකවරුන්ගේ නායකත්වය, එකමුතුකම සහ ඔවුන්ගේ සහයෝගීතාවය නිසා ස්තුති කරන්න

**ජූලි:29**- අපගේ විශ්වාසවන්ත ආධාරකරුවන් යාච්ඥාව සහ ත්‍යාගශීලී සහයෝගය නිසා ස්තුති කරන්න.

**ජූලි:30**- අපගේ යාච්ඥා හවුල්කරුවන්, දායක හවුල්කරුවන්, ඇදහිල්ලේ හවුල්කරුවන්, ජීවිත කාලය පුරා හවුල්කරුවන්, මහා නියෝගයේ හවුල්කරුවන් හා ඔවුන්ගේ පවුල් කෙරෙහි උන්වහන්සේගේ දයාව වගුරුවා ඇති නිසා ස්තුති කරන්න.

**මාර්:31**- අපගේ ශුභාරංචි පත්‍රිකා මුද්‍රණ යන්ත්‍රය අඛණ්ඩවම ක්‍රියාකාරීත්වයට සහ එහි සේවකයින්ගේ කාර්යක්ෂමතාවය නිසා ස්තුති කරන්න.

**අගෝ:01**- මෙට්‍රිකියුලේශන් පාසලට (ගමේ උසස් අධ්‍යාපන පාසල) කැපවීමක් ඇති සුදුසුකම්ලත් ගුරුවරුන් පත් කර තිබෙන නිසා ස්තුති කරන්න.

**අගෝ:02**- දේවගැති එස්. සැම් සෙල්වරාජ් සහ ඔහුගේ පවුලේ අයට බලවත් ආශිර්වාදය ලබාදී තිබෙන නිසා ස්තුති කරන්න.

**අගෝ:03**- 1969 වන වසරේ සිට අපගේ සඟරා සේවයට දෙවියන් වහන්සේ අඛණ්ඩව ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**අගෝ:04:** ශුභාරංචිය ළඟානොවූ ස්ථානවලට ළඟා වීමට දෙවියන් වහන්සේගේ කරුණාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න

**අගෝ:05**- සියලු ආගමිකයින් අතර සමගිය හා සහජීවනය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:06**- ලොව පුරා සෑම රටකටම සාමය හා සමාදානය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:07**- කාන්තාවන් සහ ළමුන්ට එරෙහිව ඇති හින්සනය මුලිනුපුටා දමන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:08**- අපගේ සහකාර කතෘවරුන්ට සහ ඔවුන්ගේ පවුල් වලට නිරෝගීකම සහ ශක්තිය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:09**- නොයෙකුත් රටවල්හි පවතින යුද්ධය සහ ස්වභාවික විපත් වලින් මනුෂ්‍යයන් ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:10**- කැඳවීමේ ප්‍රතිරාවය සඟරා සේවයට අදට වසර 57ක් සපිරෙයි. එම සේවයට තව තවත් දෙවියන් වහන්සේගේ මග පෙන්වීම ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:11**- අපගේ ජේෂ්ඨ දේව ගැති එස්. සැම් සෙල්ව රාජ්ගේ සැලසුම් වලට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:12**- සෑම ක්ෂේත්‍රයකම සැලසුම් සහ සංවර්ධනය සඳහා සෑම ජාතීන්ගේ එකමුතුකම සහ පරිපූර්ණ ප්‍රගතියක් සඳහා යාච්ඤා කරන්න.

**අගෝ:13**- ලොව පුරා විසිරී සිටින සියලුම ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා දෙන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:14**-- ලොව පුරා සිටින සියලුම තරුණ තරුණියන් සහ දරුවන්ව යක්ෂයාගේ සියලු නපුරු උපායන්වලින් ආරක්ෂා කර දෙන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:15** - නිවාඩු කාලීන බයිබල් පාසල (VB) තුළින් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයෙන් ස්පර්ශ වූ දරුවන් ස්වාමීන්වහන්සේ තුළ වර්ධනය වී විශ්වාසවන්තව සභාවට පැමිණෙන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:16**-- මිෂනාරිවරුන්ට සහ දෙවියන්වහන්සේගේ සේවයට එරෙහිව තිබෙන ප්‍රචණ්ඩත්වය අවසාන වන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:17**-- පවුල්වල බෙදීම් අරමුණු කරගෙන, ක්‍රියාත්මක වන සාතන්ගේ සියලුම ක්‍රියාමාර්ග විනාශ වන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:18**-- දෙවියන් වහන්සේගේ දරුවන්ගේ අධ්‍යාත්මික සහ ද්‍රව්‍යමය ආශිර්වාදයන් ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

තෝරා ගනු ලැබුවේ අප වැදගත් නිසා නොව උන්වහන්සේගේ අධික කරුණාව නිසාය.

## (c). ප්‍රේමය නිසා තෝරා ගත්තා!

තුන්වෙනුව දෙවියන් වහන්සේ අපව තෝරා ගනු ලැබුවේ උන්වහන්සේගේ ප්‍රේමය නිසාය. ද්වීතිය කතාව 7:7-8 හි සඳහන් කරන්නේ; ***දෙවියන් වහන්සේ ඊශ්‍රායල් සෙනගව තෝරාගත්තේ ඔවුන් විශාල සෙනඟක් නිසා නොවයි. දෙවියන් වහන්සේ ඔවුන්ව තෝරා ගනු ලැබුවේ ස්වාමීන් වහන්සේගේ අධික ප්‍රේමය නිසාය.*** උන්වහන්සේගේ තෝරාගැනීම උන්වහන්සේගේ ප්‍රේමණීය හදවත නිසාය. එය අපගේ වැදගත්කම නිසා නොවෙයි.

අපගේ අතීතය ගැන නොසිතා උන්වහන්සේ අපට ප්‍රේම කළේය. කිසි දෙයකට අපව උන්වහන්සේගේ ප්‍රේමයෙන් වෙන් කළ නොහැකිය. ඔබ මේ ප්‍රේමය අත්දැක නැතිනම් මේ පණිවිඩය ඔබටයි. දෙවියන් වහන්සේට ඕනෑම කෙනෙක් තුළින් ක්‍රියා කිරීමට පුළුවනි. කුඩා හෝ නූගත් වෙන්නට පුළුවනි. උන්වහන්සේගේ ප්‍රේමය සියල්ලන්ටම ඒකාකාරය.

## (d). පුද්ගලික තෝරාගැනීම

දෙවියන්වහන්සේ කෙනෙක්ව තෝරා ගන්නේ පුද්ගලික ලෙසයි. යෙසායා 43:1හි මෙසේ පවසයි; ***"......නුඹේ නම කියා හඬ ගැසීමි, නුඹ මාගේය."*** යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ව තෝරා ගනු ලැබුවේ පුද්ගලික ලෙසය. එසේම උන්වහන්සේ ඔවුන්ව තෝරා ගනු ලැබුවේ ඔවුන්ගේ දුර්වලකම්ද ශක්තිමත් භාවයන්ද දැනගෙනයි.

උන්වහන්සේ අපව තෝරාගනු ලැබුවේ අහඹු ලෙස නොවේය. උන්වහන්සේ අප ගැන හොඳින් දැනගෙන අපට ප්‍රේමය දක්වමින් අපව තෝරාගනු ලැබුවේය.

එමනිසා උන්වහන්සේ මාව අහම්බෙන් තෝරා ගත්තේ නැත. මා උන්වහන්සේගේ සැලැස්මේ තෝරාගැනීමකි. එය දෙවැනි තේරීම නොව හොඳම තේරීමය.

1 පේත්‍රැස් 2:9 හි මෙසේ සඳහන් වෙයි;

***"මෙසේ නුඹලා වනාහී තෝරාගත් වංශයක්ද රාජකීය පූජකයෝ ද ශුද්ධ වූ ජාතියක්ද දෙවියන් වහන්සේ සන්තක සෙනගක්ද වන්නහුය."***

අප උන්වහන්සේ විසින් තෝරා ගත් පරම්පරාවකි. උන්වහන්සේ පුද්ගලික ලෙස අපව තෝරාගෙන සිටියි.


අප එළවළු වෙළඳ සැලකට ගිය විටදී අහඹු ලෙස සෑම දෙයක්ම අප තෝරා ගන්නේ නැත. නමුත් අපගේ අවශ්‍යතාවය අනුව ඉතාම හොඳම දේ අප තෝරා ගනිමු. එසේම දෙවියන් වහන්සේත් උන්වහන්සේ කැමති දේ උන්වහන්සේට අයිති වෙන්න ඕන දේ උන්වහන්සේ කාවද තෝරගන්න ඕනි කියා තීරණය කර අපව තෝරාගෙන ඇත. රජවරුන්ගේ රජතුමා ස්වාමිවරුන්ගේ ස්වාමිතුමා මේ ලෝකය මැවූ දෙවියන් වහන්සේ අපව පුද්ගලික ලෙස තෝරාගත් නිසා අප ඉතාම ප්‍රීතිමත් විය යුතුයි.

# II. දෙවියන්වහන්සේගේ තෝරා ගැනීමේ රටාව.

දේව වචනය දෙස බලන විටදී අපට පැහැදිලි ලෙස පෙනෙන්නා වූ කාරණයක් නම්; උන්වහන්සේගේ තෝරා ගැනීමේදී රටාවයි. බොහෝවිට උන්වහන්සේ තෝරා ගන්නේ කිසිම සුදුසුකමක් නැති අයවය.

## (a) ආබ්‍රහම්

උත්පත්ති 12:1-3 දක්වා ඇති කොටසෙහි දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට කතාකොට; "නුඹ සිටින්නාවූ දේශය අතහැර උන්වහන්සේ පෙන්වන දේශයට එනම්; ඔහු නොදන්නා වූ දේශයකට උන්වහන්සේ අනුව යන්නය" කියා ප්‍රකාශ කළේය. මේ වන විට ආබ්‍රහම් ගේ වයස අවුරුදු 75ක් වූ අතර ඔවුන්ට දරුවන් සිටියේද නැත. නමුත් දෙවියන් වහන්සේ ඔහුව බොහෝ ජාතීන්ගේ පියෙක් වන බවට පොරොන්දු වූයේය.



*Abraham lied about his wife Sarah*

ආබ්‍රහම්ට ඔහු නොදන්නා වූ ඇදහිල්ලේ ගමනක් යාමට සිදුවිය. ආබ්‍රහම් නිර්දෝෂ පුද්ගලයෙක්ද? නැත. ඔහු සාරා තමාගේ භාර්යාව නොවේය කියා බොරු කීවේය. ඔහු මෙසේ බොරු කීවේ අභිමෙලෙක් ගෙන් ඇයව බේරාගන්නා පිණිසය. (උත්පත්ති 20) ඔහු හාගර් සමග සිටි අතර ඇයට දරුවෙක් ලැබුණු පසු ඔහු ඇයව අත්හැර දැමුවේය. නමුත් උන්වහන්සේ තමන් තෝරාගත් මනුෂ්‍යයා ගැන විශ්වාසවන්තව සිටියේය.

ඔබ කවුරුන් වුවත් කම් නැත - දෙවියන් වහන්සේ ඔබට විශ්වාසවන්තව සිටින්නේය!

## (b). මෝසෙස්

දෙවියන්වහන්සේ මෝසෙස්ට කතා කරනු ලැබූයේ ඔහුගේ බලාපොරොත්තු සියල්ලන්ම සුන්වී ඔහුට ඔහු ගැනම තිබූ විශ්වාසය නැති වූ විටදීය. තමා නායකත්වයට සුදුසු නැහැ කියා ඔහු පිළිගත්තේය. ඔහු එඬේරෙකු ලෙස ජීවිතය ගත කළ කල්හි ඇවිලෙන ගිනි පඳුරක් තුළින් දෙවියන් වහන්සේ ඔහුට කතා කළ අවස්ථාවේදී ඔහු ප්‍රතිචාර දැක්වූයේ අශුභවාදී ලෙසය. ඔහු සමාවට කරුණු පවසනු ලැබීය. (නික්මයාම 3 - 4 පරිච්ඡේද)

අප අතරින් කීදෙනෙක් මෙලෙස කරනවද? ස්වාමීන් වහන්සේ අපගේ ජීවිතය තුළ උන්වහන්සේගේ අරමුණ ඉටු කිරීමට යන විට අප සමාවට කරුණු ඉදිරිපත් කරමින් බොහෝ දේ පවසනු ලබයි.

මෝසෙස් ඔහු ගැන තිබූ හීනමාන තත්වය ප්‍රකාශ කරනු ලැබූයේ මෙලෙසය.

....Contd. to page 8

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

Pray for

**NEHEMIAH BIBLE COLLEGES,**

Chepauk & Santhoshapuram, Velachery Chennai.

Qualification : 10th Standard & above

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

**Rush for admission!** Medium : Tamil (Part Time)

Hindi (Residential) (Sponsorship Available)

**Diploma in Theology**

Recognised by International Christian Leaders & Senior Pastors for the past 55 years

**Contact : The Chairman, Nehemiah Bible College.**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.

Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858

E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

### "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

## දෙවියන්වහන්සේගේ අලංකාර දෑතේ අනර්ඝ සේවකයෝ

ශුභාරංචි සේවය කළා වූ බොහෝ දේවදාසීන්ගේ ජීවිත කතාවල ඉතිහාසය දෙස බලන විට අපගේ පිය වූ දෙවියන්වහන්සේ මෙවැනි අනර්ඝ දේවදාසීන්ගේ සියලු අවශ්‍යතා සපුරමින් ඔවුන්ව රැකබලා ගත් ආකාරය අපට පෙනී යයි. ඔවුන් සාර්ථකව සේවයේ යෙදවීමට උන්වහන්සේ උපකාර කරනු ලැබීය. ස්වාමීන් වහන්සේ ඔවුන්ව අනාථ කළේ නැත.

1982 වන වර්ෂයේදී චෙන්නෙයිවල පිහිටි ගම්මානයක ශුභාරංචිය ප්‍රකාශ කිරීමට මා හට ආරාධනයක් ලැබී තිබුණි. එම වැඩසටහන මුළු දවස පුරාම පැවැත්වීමට නියමිතව තිබුණු නිසා මා හට දුම්රියෙන් එම ස්ථානයට යාමට සිදුවිය. ඊට ප්‍රථම දිනයේදී මෙම රැස්වීමට උපකාර කරන පිණිස මගේ සමහර සේවකයින් එහි ගොස් තිබුණි. මා නියමිත දවසේ උදෑසනින් මගේ සෑම දේම සූදානම් කරගෙන මෙම ගම්මානයට යන පිණිස දුම්රියපළ වෙතට ගියෙමි. නමුත් මා සෑම දේම සූදානම් කළ නමුත් මෙම ගමනට අවශ්‍ය මුදල් සූදානම් කළේ නැත. එම නිසා මා හට එම ස්ථානයට යාමට ටිකට් පතක් ලබා ගැනීමට අසීරු වූයේය. මා දුම්රිය පළ වෙතට පැමිණි විට විටදීම එම ගමන යාමට අවශ්‍ය මුදල මා සතුව නොමැති බව මට මා දුටුවේය.

එපමණක් ද නොව එහිදී දුම්රිය ත් ලබා ගැනීමට සඳහා බොහෝ දිගු පෝලිමත් ද තිබුණි. එම රැස්වීමට මගේ පැමිණීම ඔවුන් බලාපොරොත්තුවෙන් සිටි නිසා මමද ඇදහිල්ලෙන් ගොස් එම පෝලිමේ සිට ගත්තේය. මා දෙවියන් වහන්සේගෙන් හාස්කමක් බලාපොරොත්තු වූයෙමි.

සෙමින් සෙමින් ටිකට්පත් පෝලිම ඉදිරියට ගමන් කළේය. මා ඉදිරියේ සිටි අය ඔවුන්ගේ මුදල් රැගෙන ඔවුන්ට අවශ්‍ය ටිකට් පත ලබා ගත්ත නමුත් මා හිස් පසුම්බියක් තබාගෙන කුමක් කළ යුතුද කියා නොදැන සිටි නිසා ටිකට් පත් නිකුත් කරන ස්ථානයට සමීප වෙන්න සමීප වෙන්නෙ මගේ හදවත ගැහෙන්නට පටන් ගත්තේය.

මා ටිකට් පත් කවුන්ටරයා අසලට ගියවිට එහි සිටි පුද්ගලයා; "ඔබ යන්නේ කොහාටද?" කියා ඇසූ විට මා යන්නට අවශ්‍ය ස්ථානය පැවසුවේය. එවිට; "මහත්මයා මේ පුද්ගලයාගෙන් මුදල් ගන්න එපා, මා ඔහු සමග මෙම දුම්රියේන් ගමන් කරනවා. ඔහුගෙන් මුදල් නොගෙන ටිකට් පත ලබාදෙන්න" කියා මගේ පිටුපසින් මා හට හඬක් ඇසුණේය. එනිසා ඔහු මගේ ටිකට් පතට මුදල් ගත්තේ නැත. මන්ද මා හට ටිකට් පත ලබාදුන් පුද්ගලයා ඔහුගේ මිත්‍රයෙක්ය.

මගේ හදවත කඩා වැටුණි. මා එම ස්ථානයෙන් පිටතට ගොස් කුඩා දරුවෙක් මෙන් හඬා වැටුනෙමි. මන්ද මගේ ස්වාමීන් වහන්සේ මා වැනි කුඩා දාසයෙක්ගේ අවශ්‍යතා සපයන්නේ කෙසේද කියා ය. මගේ ටිකට් පත ගත් පුද්ගලයා සමග මා දුම්රියෙන් ගමන් කළෙමි. ඔහු සමග මගේ සේවය ගැන මා බෙදා ගත්තෙමි. ඔහුද දෙවියන් වහන්සේව දන්නාවූ පුද්ගලයෙකි. අප දෙදෙනා එකතු වී දෙවියන්වහන්සේට ස්තුති කළෙමු. එදා දින තිබූ දේව මෙහෙයට දෙවියන්වහන්සේ බලවත් ලෙස ආශිර්වාද කළේය.

මෙය කියවන්නා වූ සහෝදරයා සහෝදරිය, අපගේ ස්වාමීන් වහන්සේට ඔබගේ සියළු අවශ්‍යතා සපුරාලීමට පුළුවනි. ස්වාමීන්වහන්සේ ඔබව සේවයට කැඳවනවා නම්; ප්‍රමාද නොවී සේවය ආරම්භ කරන්න.

"නුඹලා අනාථව නාරින්නෙමි." (යොහාන් 14:18)

************

....Contd. from page 6

නික්මයාම 3:11 :*"පාරාවෝ වෙතට යන්ටත් ඊශ්‍රායල් පුත්‍රයන් මිසරයෙන් පිටතට ගෙන එන්ටත් මම කවුදැයි"*

නික්මයාම 4:1 ;*"එහෙත් බැලුව මැනව ඔවුන් මා විශ්වාස නොකොට..."*

නික්මයාම 4:10 : *".....මීට ප්‍රථමවත් ඔබ තමන් මෙහෙකරුවාට කතා කළාට පසුවවත් මම වාක්තයෙක් නොවෙමි........"*

නික්මයාම 4:13 *"ඔහු: අහෝ ස්වාමීනි, ඔබවහන්සේ යවන්ට කැමැත්තෙකු අත යැව්ව මැනවයි කීය."*

**මේ තුළින් අපට පෙනෙන්නේ**

මෝසෙස්ගේ නොහැකියාවත් ඔහුගේ නොවටිනා කමත්ය. නමුත් දෙවියන් වහන්සේ බැලුවේ වෙනත් ආකාරයකටය.

නික්මයාම 3:10 : *"ඉතින් වරෙන්නෙ නුඹ මාගේ සෙනඟවූ ඊශ්‍රායල් පුත්‍රයන් මිසරයෙන් පිටතට ගෙනෙන පිණිස මම පාරාවෝ වෙතට නුඹ යවන්නෙමියි කීසේක."*

දෙවියන්වහන්සේ මෝසෙස්ව දුටුවේ ගැලවුම්කාරයෙක් නායකයෙක් හා ආරක්ෂක තැනැත්තෙක් ලෙසය. එසේම උන්වහන්සේගේ සෙනග උදෙසා බොහෝ දේවල් කිරීමට හැකි පුද්ගලයෙක් ලෙසය. මෝසෙස්ට තමා ගැනම සැකයක් තිබූ නමුත් දෙවියන්වහන්සේ ඔහුට දිව්‍යමය සේවයක් ලබා දුන්නේය. මෙය කියවන විටදී සමහර විට දෙවියන් වහන්සේ ඔබටද කතා කරනවා ඇත. ඔබ ඔබවම අඩු තක්සේරු කරගෙන ඇත. නමුත් ඔබ ඔබගේ බලාපොරොත්තුවේ කෝණය වෙනස් කරගෙන දෙවියන් වහන්සේ බලන්නාවූ කෝණයෙන් බැලිය යුතුය.

දෙවියන්වහන්සේව සීමා නොකරන්න. දෙවියන්වහන්සේ මෝසෙස්ට කතා කරන විටදී ඔහුට වයස අවුරුදු 80කි. මෝසෙස් දෙවියන් වහන්සේට යටත් වූ විට දෙවියන්වහන්සේ ඔහුව බලවත් නායකයෙක් ලෙස පත්කළේය. අපගේ ජීවිතයේ ප්‍රධානම කාරණය විය යුත්තේ; අපගේ ජීවිතය දෙවියන් වහන්සේට යටත් කිරීමයි. සියල්ල දෙවියන් වහන්සේගේ පාමුල තැබිය යුතුය.

## (c). දාවිත්



*God chose David for his heart*

දාවිත් උසස් පවුලකට අයිති වූ කෙනෙක් නොවේය. ඔහුගේ පවුල ගැන බලන විටදී ඔහුට විශාල පවුල් පසුබිමක්ද නොමැත. ඔහුගේම පවුලේ අය දාවිත්ව ගණන් ගත්තේද නැත. ඔහුව දෙවියන් වහන්සේ ආලේප කර තිබුණත් ඔහුගේ පවුලේ අය ඔහුව අමතක කර තිබුණේය. නමුත් ඔහු ඊශ්‍රායල් හි බලවත් රජෙක් විය.

***"........ ස්වාමීන් වහන්සේ මනුෂ්‍යයා බලන්නාක් මෙන් නොබලන සේක. මනුෂ්‍ය තෙමේ පිටස්තර පෙනීම බලන්නේය. නුමුත් ස්වාමීන්වහන්සේ සිත බලනසේක." (1 සාමුවෙල් 16:7)***

දාවිත් පව් කළ විටදී දෙවියන්වහන්සේ ඔහුගේ දරුවාගේ ජීවිතය ගනිමින් ඔහුව විනයට පත්කරනු ලැබීය. එහෙත් දෙවියන් වහන්සේගේ කරුණාවත් විශ්වාසවන්තකමත් දාවිත් කෙරෙහි තිබුණි. දාවිත් පසුතැවිලි වූයේය. දෙවියන්වහන්සේගේ ප්‍රේමය උන්වහන්සේ ඔහුගෙන් ඉවත් කළේ නැත. මන්ද දෙවියන් වහන්සේ ඔහුව තෝරා ගනු ලැබුවේය.

## (d). ගෝලයින්

යේසුස්වහන්සේ තම ගෝලයින් දොළොස් දෙනාව තෝරාගනු ලැබූයේ විවිධ පසුබිම්වලින්ය. මතෙව් සුංගම් අයකරන්නෙක්ය. සීමොන් ජ්වලිතයකි. තවත් බොහෝ අය මසුන් අල්ලන්නන්ය. මේ සියලු දෙනාම සාමාන්‍ය පුද්ගලයින්ය. ඔවුන් තුළ බොහෝ වැරදි හා අඩුපාඩු තිබූ අයයි.


**Pray for**
**URGENT NEED**
**for**
CHRISTIAN OFFICE

**1. COMPUTER OPERATORS**
**2. PRINTING PRESS OPERATORS**

**Contact : (+91) 98412 71858, E.mail : sam@echoofhiscall.org**



**NOTICE**

Please store the Mobile Phone numbers (+91) 98410 71858, (+91) 98412 71858 of Pastor S. Sam Selva Raj on your mobile phones.
- Editor



**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for**

**THEOLOGICAL CORRESPONDENCE COURSE**

Advanced Distance Education called **Theological Correspondence Course** is available in English – 537 pages and Tamil – 652 pages for Pastors, Evangelists, Christian Leaders and for lay people who have passion to do God's Ministry! A fee of Rs. 1000/- is charged. 7 Books with 149 Chapters are supplied. **Certificate in Ministry** will be awarded. **God will bless you!**



**The Chairman, Nehemiah Bible College,**
**Echo of His Call, Post Box 2957,** CHEPAUK, CHENNAI - 600 005.
**Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858**
**E.mail : biblecor@yahoo.co.in**

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

නමුත් උන්වහන්සේ ඔවුන්ව තෝරාගනු ලැබුවේය. යේසුස් වහන්සේ පේතෘස්වද තෝරාගනු ලැබුවේය. උන්වහන්සේගේ මෙම තෝරාගැනීම නැවත වෙනස් කලේද නැත. ක්‍රියා පොතේ සඳහන් පෙන්තකොස්ත දිනයෙන් පසු ඔවුන්ගේ ජීවිතවල මහත් වෙනසක් ඇති විය. දෙවියන්වහන්සේගේ බලය ඔවුන්ගේ ජීවිතවල ක්‍රියා කලේය.

ප්‍රිය මිත්‍රවරුනි, දෙවියන් වහන්සේ අපව තෝරාගනු ලැබූයේ අපගේ කිසිම සුදුසුකමක් නිසා නොව උන්වහන්සේගේ දිව්‍යමය සැලැස්ම හා උන්වහන්සේගේ වෙනස් නොවන්නා වූ ප්‍රේමය නිසාය.

එසේම දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ කරන පිණිස උන්වහන්සේ බෙලහීන අයව තෝරාගනු ලැබීය. උන්වහන්සේ ප්‍රඥාවන්තයින් ලැජ්ජාවට පත් කරන පිණිස ලෝකයේ මෝඩ දේ තෝරාගන ගනු ලැබුවේය. අප ඉල්ලනවාටත් සිතනවාටත් වඩා අප තුළ මහත්දේ කිරීමට හැකි නිසා අපව තෝරා ගත්තේය.

අපගේ දෙවියන් වහන්සේගේ බලය නම් මෙයයි.

උන්වහන්සේට ඕනෑම කෙනෙක්ව උන්වහන්සේගේ බලය හා මහිමය උදෙසා පාවිච්චි කිරීමට හැකිය.

***මතක තබාගන්න: ඔබව දෙවියන් වහන්සේ තෝරාගෙන ඇත.***

උන්වහන්සේගේ දිව්‍යමය සැලැස්ම ඉෂ්ට කිරීමට උන්වහන්සේ ඔබව තෝරාගෙන තිබේ.

මාගේ යාච්ඤාව නම්; උන්වහන්සේ වෙනුවෙන් පලදරන්නාවූ ජීවිතයක් ගත කිරීමයි. අප එකිනෙකාව උන්වහන්සේ පාවිච්චි කළ යුතු බවයි. මන්ද උන්වහන්සේ නැවත පැමිණෙන විටදී ඵල දරන්නා වූ අය ගෙනයාමට පැමිණෙයි. උන්වහන්සේ පැමිණෙන්නේ ඔබව තෝරාගත් නිසා. එබැවින් ඔබ ඵල දරන්නාවූ ජීවිතයක් ගත කරන්න.

************


# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps **(Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.)** to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.



Our address :

**ECHO OF HIS CALL**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org



**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS Patrika Channel"**

on 2nd **JULY 2025.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

**P.O. Box No. 2957,**

**Chepauk, Chennai - 600 005, INDIA.**

**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**


***JESUS LOVES YOU!***

To

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**